ශ්‍රී ලංකාවට අවුරුදු හිරු උදාවත්ම අගනුවරට ආසන්නව අගනුවර වැසියන්ගේම නිර්මාණයක් වූ මීතොටමුල්ලේ මහා කුණු කන්දරාව කඩා වැටීමෙන් අගනා මිනිස් දිවි දුසිම් ගණනක් රටට අහිමි වී ගියේ ය. ඉස්සර සිසිල් සුළං හමා අවුත් ගමේ ජනයාගේ හදවත් සිසිල් කළ වෙල් යායේ ගොඩ ගසන ලද කොළඹ කුණුගොඩට යට වී පොළෝ තළයටම යට වී ගිය නිවාස ගණන එකසිය පනහකට

වුවත් මා කියන දේ කෙළින්ම කීමට හෝ ලිවීමට ශ්‍රී ලාංකික විචාරකයන් හා විද්වතුන් පසුබට වන පාටක් පෙනෙනෙ නිසාවෙන් මගේ අදහස් කියා පෑම අවශ්‍ය යයි ද සිතමි. රතුපස්වල - අරනායක - සාලාව වැනි පෙ-දෙස් ගණනාවක ජනතාවට මුහුණ පෑමට සිදු වූ අපරාධ සහ ව්‍යසන ගැන කළ යුතු පිළියම් තවමත් හරි හැටි සිදු නොවූ බව මට සිතාගත හැකි ය. එසේ වූවා නම් සාලාව ගින්නෙන් අවතැන් වූවන් අද පවා පාරට බැස විරෝධය

ජනාධිපතිට නාගදීප වවා වන්දනා කිරීමට යාම නිසා ඉඩක් නොලැබුණ යයි කියමු. ඊට පස්සේ ඔහු මොනවා දෝ කොල වගයක් විපතට පත්වූවන්ට පිළිගැන්වීම සඳහා ඔවුන් කැඳවා තිබුණේ මොකක්ද කාර්යාලයකට ය.

අලියාට ඇස් තැබීම - කනාමුට්ටිය බිඳීම

# වසන්ත උදාව සහ වෙසක් උදානය






**<u>දිවයින පුවත්පත කියන ආකාරයට ලොස් ඇන්ජලීස් නගරයේ ඉදි කිරීමට යෝජනා කරන ලද ශාක්‍ය ජනපද ආකෘතිය ශ්‍රී ලංකාවට ආනයනය කර ගැනීමට බුද්ධසාසන අමාත්‍යංශය සමත් වූ බව විජයදාස රාජපක්ෂ ඇමතිවරයා ප්‍රකාශ කොට ඇත.</u>**

ආසන්න විය.

මට එක් වරම සිහියට නැගෙන්නේ මා උපන් පිටිසර ගමේ එදා පැවති තත්වයයි. වාතාවරණයයි. ගමේ අන්ත අසරණ මිනිසකුගේ අවමගුලක් දාට මුළු ගමම ඒ සොවින් කම්පාවට පත්වීම උස් - මිටි භේදයකින් තොරව සිදුවූවකි.

එය පළ වූයේ හඩාවැළපීමකින් නොව මුළු ගමම එක්තරා නිහඬ ස්වභාවකින් - තමන්ගේ සංවේගය - සහානුභූතිය ඒ මිය-යාමට පත්වූවන්ගේ පවුල වෙත නිර්වාචිකව නිකුත් කරන පණිවුඩය ඔස්සේ ය.

ඒ සංවේදනාව පළ වනුයේ තමන් කරන වැඩ කටයුතුවල දීය. නිදසුනක් වශයෙන් ගමේ ගමේ පවත්වන මගුල් උත්සවයක් ඇතොත් එහි පවා ගමටම ඇසෙන පරිදි හඬ නගන සංගීතය එදාට ඇසෙන්නේම නැත.

මගේ වැටහීම අනුව එය ගමට පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකික ජනතාවටම ආ-වේණික වූ සත්ගුණයක් ය - සච්චාරිත්‍රයක් ය. මගේ අතීතාවර්ජනාවට හේතුවූයේ සිංහල අවුරුදු සැණකෙළි හා වෙසක් සැණකෙළි ගැන දකින - අසන පුවත් පිට පිටම නෙත ගැටෙන - කණට ඇසෙන සුපුරුදු ගායනාව වීමය.

දුර නිසා බණ කියන එක සුළු වැඩක් යයි කීමට ඔබට ඉඩ ඇති බවද මම දනිමි. එසේ පාන්නේ නැත.

මගේ සිහියට නැගෙන තවත් අලුත් පුවතක් ඇත. වර්ෂය 1971 යයි සිතමි. කර්මාන්ත අමාත්‍ය ටී බී සුබසිංහගේ කන්තෝරුව . ඇමතිවරයා ඉදිරිපිට වාඩි වූ තිදෙනෙක්. විමල් කරුණානන්ද (.. සංස්ථාවේ සාමා-න්‍යාධිකාරි) හෙක්ටිර් අබයසේකර (කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ නිලධාරියෙක්) සහ මම ද එහි සිටියෙමු.

ඇමතිවරුන්ට ලැබෙන වාහන ගැන කතාව පටන් ගත්තේ කවුරුන්දැයි මට මතක නැත. මට මතක හිටියේ විමල් කරුණානන්ද කළ යෝජනාව පමණි. මහජන මුදල් ඉතිරි කිරීමේ පියවරක් හැටියට පුංචිම කාර් එකක් - වොක්-ස්වාගන් රියක් - ගැනීම සුදුසු බව ඔහු පැවසුවේ සැදැහි සිතිනි ය. සුබසිංහගේ මුහුණට නැගුණ වලාකුළ මට තවම මතකය.

මහා භාරතයේම නිපදවන රථය සියලූම මැති ඇමතිවරුන්ට සුදුසු බව ඒ රට තීරණය කළ ද අල්ලපු රටේ නායකයන්ට ඒ වාගේ සිල්ලර වාහන අල්ලන්නේ නැත.

කෝටි ගණනක මහජන මුදලින් ගෙන්වා (හෙට අනිද්දා විකිණීමට ඇති) රථ කීයක් නම් මීතොටමුල්ල දෙසට ධාවනය කරන්නට ඇද්ද? මුකවාඩම් බැඳගෙන ගිය අගමැති හැරෙන්නට මරික්කාර් බඳු දෙතුන් දෙනකු ගිය බව වාර්තා විය.

වැනි සෙල්ලම් කරමින් අවුරුදු සැණකෙළියකට රැස්ව සිටි මැතිඇමති පිරිසක් රූපවාහිනියේ ප්‍රදර්ශනය වූහ. ඔවුන් සහභාගි නොවූ එකම සෙල්ලම ලිස්සන ගහේ නැගීම යයි සිතමි. මේ සියළුම කෙළකවටකම් සිදු වූයේ මීතොටමුල්ලේ ව්‍යසනය සිදු වූ දින හෝ ඉන් දෙතුන් දිනකට පසුව ය.

ලක්ෂ ගණනින් මුදල් වැය කොට පවත්වන ලද වයිවාරන්න අවුරුදු සැණකෙළි දැන් හමාර වෙලා ය. දැන් වෙසක් උදානයට කාලය ඇවිල්ලා ය. ප්‍රීති වෙසක් සමය දැන් උදා වී ඇත.

2017.05.09 දින දිවයින පුවත්පත කියන ආකාරයට ලොස් ඇන්ජලීස් නගරයේ ඉදි කිරීමට යෝජනා කරන ලද ශාක්‍ය ජනපද ආකෘතිය ශ්‍රී ලංකාවට ආනයනය කර ගැනීමට බුද්ධසාසන අමාත්‍යංශය සමත් වූ බව විජයදාස රාජපක්ෂ ඇමතිවරයා ප්‍රකාශ කොට ඇත. පිළියන්දලට නුදුරු ගමක ඉදිවන සිදුහත් උපන් බිම පිහිටි ශාක්‍ය ජනපදය නිර්මාණය කිරීමට ගිය වියදම රුපියල් කෝටි පනහකි (50) එයට රජයේ මුදල් වැය නොවූ බව ද ඇමතිවරයා පවසා ඇත. නවතම ශාක්‍ය ජනපදය තුළ ඉදි වන නවතම පහසුකම් ගැන ද විස්තර පළ වී ඇත. ඒ අතරම දියවන්නාවද ප්‍රීති වෙසක් ශ්‍රීයෙන් බබලවන්ට යන්නේ ය.

වැඩිදුර විස්තර නොකොට මගේ හිතට එකම එක සැකයක් - ප්‍රශ්නයක් - සඳහන්කොට මේ ලිපිය හමාර කරමි.

බුදු බණට අනුව වෙසක් දිනය හා ඒ හා බැඳුණු උත්සව කවර අරමුණක් ඇතිව සිදු විය යුතු ද? කළ යුතු ද? ජාත්‍යන්තර වෙසක් දිනයක් සම්මත කරවා ගැනීම ගැන කදිරගාමර් ඇමතිට සිට තවත් අයට ගරු කිරීමට එය මහා ඝෝෂාවක් සහිත සැණකෙළියක් බවට පරිවර්තනය කරගත යුතුද?

සෝබනයට හෙවත් ලෝකෙට පරකාසය සඳහා කරන උත්සව තවත් වරක් බලයට ඒමට දේශපාලකයන්ට පාර කපා ගැනීමක් විය යුතුද? එමගින් රටට - අපේ අනාගත පරපුරට දෙන ආදර්ශව පණිවුඩය කුමක්ද?

ගසාකෑම දිගටම කරගෙන යාමට මෙහෙම පින් කළ යුතු බව කීමද?

